**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදාවන් සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය මෙතැන් සිට කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නට 'සන්නස' තීරණය කරයි.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**



# තමිළිනීගේ කතාව

1

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

## 2002 වසර... පෙබරවාරි මාසය...

2002 වසරෙහි පෙබරවාරි මාසය, වැසි කාලය අවසන්ව, පිනි වැටීමද අඩුවී ගොස් වසන්ත කාලය ආරම්භ වී තිබුණි. විශාල ගස්වල වෙළී, වැඩී පැතිරී තිබුණ ලතාවල පිපී හිනැහෙන වර්ණවත් පුෂ්පයන්ගේ සුවඳ සුළඟට මුසුව සෑම දෙසකම පැතිර යමින් තිබුණි. ගස් අතු මත වඳුරෝ බියක් සැකක් නොමැතිව ඔංචිලි පදිමින් උන්හ. තලගොයි පැටවු හුඹස්වලින් එළියට පැමිණ බඩගාමින් උන්හ. පැතිරුණු තණ පලසේ විසුරුණු පිනිකැටවලින් හා පැටවු පිපාසය සංසිඳුවා ගනිමින් උන්හ. මොනර රංචු උදයේ තරුණ හිරු රශ්මියේ තම පිල් කළඹ විහිදුවා එය වියළා ගනිමින් උන්හ. කුකුළෝ සහ දෙමලිච්චෝ ගොදුරු සොයා යමින් උන්හ. අනවසරයෙන් පුපුරන බෝම්බවල මහත් වූ කම්පනයන් ද, ගිනි දැල් හා වෙඩි බෙහෙත් ගඳ නැතිව ගොස් නතරව පවතින යුද්ධයෙන් හිමි වූ ඉමහත් සැනසිලිදායක පරිසරයෙහි වන්නි වන පෙත සතුටින් පොපියන්නට විය.

2002 වසරෙහි ලංකා රජය සහ විමුක්ති කොටි සංවිධානය සටන් විරාමයකට පැමිණ ඇති කරගත් එකඟතාවයෙහි පළමු අදියර වූයේ A9 මහා මාර්ගය ජනයාගේ භාවිතය උදෙසා විවෘත කිරීමයි. ලංකාවේ මධ්‍යම කඳුකරයෙහි මහනුවර නගරයත්, ලංකාවේ උතුරු කෙළවරෙහි යාපනය නගරයත් යා කරන මෙම මාර්ගය වනාහී කිලෝ මීටර් තුන්සිය විසි පහකින් යුක්තය. ආසියාවේ ප්‍රධාන මහා මාර්ගයන් අතරින් එකක් ලෙස වර්ගීකරණයට ලක්ව පැවැති මෙම A9 මාර්ගය, ලංකාවේ නගර කීපයක් පසුකරමින් ඇදී යයි. ලංකාවේ රජයේ හමුදාවට එරෙහිව දෙමළ විමුක්ති සංවිධාන ආයුධ අරගල කිරීමට පටන් ගත් කාලයෙහිදී, 1984 වසරෙහි සිට 2006 දක්වා මෙම මාර්ගය කීප වතාවක්ම මහජනයාට ගමනාගමනයෙහි යෙදිය නොහැකි වන සේ වසා තිබිණි.

2002 වසරෙහි පෙබරවාරි මාසයෙහි පහළොස්වන දින විවෘත කිරීමට නියමිතව පැවැති මෙම මාවතෙහි සියයට විස්සක පමණ කොටසක් පැවැතියේ දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයෙහි පාලනයට යටත්වය. එහෙයින් A9 මාර්ගය විවෘත කිරීම යනු ජාත්‍යන්තර අවධානයට ලක්වූ කරුණක් විය. මෙම විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීම සඳහා විමුක්ති කොටි සංවිධානයෙහි දේශපාලන අංශය වෙනුවෙන් තවත් සටන්කාමී සහෝදරියන් කීප දෙනෙක් සමඟ මම ඕමන්තේ ප්‍රදේශයට ගොස් සිටියෙමි.

දේශපාලන අංශයේ දෙවන භාරකරු සුදා (තංගම්) සහ කොටින්ගේ සාම කාර්යාලයෙහි අධ්‍යක්ෂ වූ පුලිත්තේවන් යන අය සමඟ තවත් සටන්කාමීහුද මෙම අවස්ථාවට සහභාගි වූහ. ලංකා හමුදාවේ මුර කපොලුද, විමුක්ති කොටින්ගේ මුර කපොලුද, මුහුණට මුහුණ ලා සකස් කර තිබුණි. ඒවාට හරස්වී, පාර පස් බැම්මවලින් සහ වෙනත් ආවරණයන්ගෙන් වසා තිබුණි. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය ආදී සංවිධානවල ඉහළ පෙළ නියෝජිතයන් ඉදිරියේ මෙම මාර්ගය පොදු ජන භාවිතය උදෙසා විවෘත කළේය.
ජීවිත දහස් ගණනක රුධිරයෙන් තෙත් වී තිබුණු මෙම මාර්ගයේ අනෙක් පස හමුදාවද අප සේම එක් රැස්ව උන්නේය. ඔවුහු සහ අපි අත් වනමින් සහ සිනහ පාමින් අන්‍යෝන්‍ය වශයෙන් සාමය ප්‍රකාශ කර ගත්තෙමු. නමුදු අපි අපේ අනෙක් අතින් දැඩි ලෙස ආයුධ දරාගෙන සිටියෙමු. දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය දිගින් දිගටම අත්කරගත් යුද්ධමය ජයග්‍රහණ හේතුවෙන් ලංකා ආණ්ඩුව සාකච්ඡා සඳහා පසුබැස අතැයි යන අදහසද සංවිධානයෙහි නායක ප්‍රභාකරන් ඇතුළු අප සියලු දෙනා කෙරෙහිම බලපෑමක් ඇති කර




තිබුණි.

A9 මාර්ගයේ ජනමාධ්‍යවේදියෝ රංචු ගැසී උන්හ. යුද්ධය පැවැති කාලයෙහිදී වන්නි යුද්ධ ප්‍රදේශයට ජනමාධ්‍යවේදීන් ඇතුළුවීමට අවශ්‍ය අනුමැතිය කොටි සංවිධානය විසින්ද, හමුදාව විසින්ද, සම්පූර්ණයෙන්ම නවතනු ලැබ තිබුණි. එම ස්ථානයට පැමිණ සිටි දේශීය සහ විදේශීය ජනමාධ්‍යවේදීන්ව දුටු විට මා තුළ ඇතිවූයේ 'ලෝකයේ ඇස් අප දෙසට යොමුව ඇත' යන හැඟීමයි. ක්ලික් ක්ලික් යැයි විදුලි ධාරා දිස්වෙන ඡායාරූප කැමරා ද, වීඩියෝ උපකරණ ද, දිගු මයික්‍රෆෝන් ද, ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍රද සහිතව සන්නද්ධව සිටි ජනමාධ්‍යවේදී බළසේනාවක් පුල්ලි ඇඳුම් ඇඳ ආයුධ සහිතව උන් කොටින් වන අපව වටකරගෙන උන්නේය.

එහි පැමිණ සිටි ජනමාධ්‍යවේදීහු තම ප්‍රශ්න හී සර සේ අප වෙත එල්ල කරන්නට වූහ. එහෙත් සෑම ප්‍රශ්නයක්ම එක මූලික කරුණක් වටා කේන්ද්‍රව පැවතිණ. තම පූර්ව නිගමනයන්ව පැවැති පිළිතුරු, සටන්කාමීන්ගේ මුවින් පිටතට ගැනීමට ඔවුහු උත්සුක වන්නා සේ පෙනුණි. ආයුධ ගෙන සටන් කළ ඔබලා සාමකාමී මාර්ගයකට පැමිණියේ ඇයි? දෙමළ ඊළම අතහැර දැමුවේද? ඔබලාගේ සටන්කාමී අරගලකරුවන් දහස් ගණනින් මිය ගොස් සිටින තත්ත්වයක් තුළ ඔබලාගේ නායකයා දෙමළ ඊළම අතහැර දැමුවහොත් ඔබලා එය පිළිගන්නවාද? නැවතත් යුද්ධය ඇති වෙයිද? ඔබලා තුළ සාමය පිළිබඳව විශ්වාසයක් පවතින්නේද? ඔබලා නැවතත් යුද්ධ කරනවාද? නිවෙසට යාමට කැමැත්තක් නැත්ද? ප්‍රේම සම්බන්ධතා පවතිනවාද? විවාහ වෙනවාද? සංවිධානය ඒවාට අනුමැතිය දෙයිද? ඇයි කොණ්ඩය මෙහෙම නවලා බැඳලා තියෙන්නේ? ඔබලා සහ සමාජයේ අනෙක් කාන්තාවන් අතර පවතින වෙනස කුමක්ද? සමාජය නැවතත් ඔබලා අනුමත කරාවි යැයි ඔබලා සිතනවාද? යනාදී වශයෙන් සිය ගණනක් ප්‍රශ්න එම ස්ථානයෙහි සිටි සටන්කාමීන් වෙත එල්ල විය.

සංවිධානයෙහි මහලේකම් කාර්යාලය විසින් නිකුත් කරනු ලබන නිල නිවේදන පුවත් යනාදියට අමතරව සාමාන්‍ය සටන්කාමීන්ගේ සහ අතරමැදි තත්ත්වයෙහි සිටින සටන්කාමීන්ගේ සාමාන්‍ය මානසික තත්ත්වය භාරා ඇවිස්සීම මාධ්‍යවල උපක්‍රමය විය. මාධ්‍යවලට පිළිතුරු දීමේ අවසරය සංවිධානයෙහි කිහිප දෙනෙකුට පමණක් තිබුණි. එහෙයින් මෙවැනි අවස්ථාවක් ඇතිවූ විට බොහෝ සටන්කාමීහු සිනා මුසුව එම ස්ථානයෙන් ඉවත්ව මගහැර යති. A9 මාර්ගය විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවූ මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ අනුමැතිය මමත්, තංගන් සහ පුලිදේවන් යන අයත් ලබා උන්නෙමු. 2002 වසරෙහි, අප්‍රේල් මාසයෙහි, අටවෙනිදා මුහමාලෙ හරහා යාපනය සඳහා වන A9 මාර්ගය විවෘත කරන ලදි. මෙය පොදු ජනයා විශාල වශයෙන්ද, සටන්කාමීහුද, සෙන්පතිවරුද සහභාගිවූ මහත් උද්යෝගිමත් අවස්ථාවක් විය. ජාත්‍යන්තර නියෝජිතයන්ගේ සහභාගිත්වය සිදුවූ මෙහිදී කොටි සංවිධානයෙහි ප්‍රමුඛ අණ දෙන නිලධාරීන් වූ බ්‍රිගේඩියර් බානු, දීපන් යන අයත්, ලංකාවේ හමුදාවේ යාපනය දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන අණ දෙන නිලධාරීන්ද මුහුණට මුහුණ හමුවී, අතට අත දී ආචාර කරගත්හ. ජීවිත දහස් ගණනක් බිලිගත් කුරිරු සටන් විශාල සංඛ්‍යාවක් උතුරු සටන් පෙරමුණ සතු විය. දැවී විනාශ වී ගිය පොල්වතුද, තල් රුප්පාවන්ද සහිත එම බිම එදින පොද වැස්සට තෙත් වෙමින් තිබුණි.

යාපනය දිස්ත්‍රික්කයෙහි දේශපාලන කටයුතු සඳහා යවන ලද සටන්කාමීන්ගේ කණ්ඩායම එහි බාරකරු වූ ඉලම් පරිදි සමඟ රැස්ව සිටි ජනකාය විසින් පෙරහැරින් කැඳවා ගෙන යන ලදි. ඇත්තෙන්ම ඕමන්දෙ ප්‍රදේශයෙහිදී සහ මුහමාලෙවල පැවැත්වූ A9 මාර්ගය විවෘත කිරීමේ උත්සවය ආණ්ඩුව සහ කොටි සංවිධානය අතර සාමය සඳහා වන පූර්ව උත්සාහයක් ලෙසින් ජාත්‍යන්තර ප්‍රජාව විසින් සිදුකරන ලදි. ලංකාවේ රජය සහ හමුදාව කුමන කුමන මනෝ විද්‍යාත්මක පදනමකින් මේ දෙස බලන්නේද යන්න මම නොදැන සිටියෙමි. නමුත් විමුක්ති කොටි සංවිධානය තමන් විසින් අත්පත් කරගත් මහත් විශාල මිලිටරිමය ජයග්‍රහණවල ප්‍රතිඵලයක් ලෙසින් මෙය දුටුවේය. දීර්ඝ කාලයකට පසුව ජනතාවට හිමිව තිබූ සාමයත්, මාර්ගය විවෘත කිරීම, ආර්ථික සම්බාධක ඉවත් කිරීම යනාදියත් සාමාන්‍ය ජනයාගේ මුහුණුවල නව ආලෝකයක් උදාකර තිබුණි. එහෙත් මෙම සාමකාමී වාතාවරණය දිගු කර ස්ථිර විසඳුමක් කරා කොටි සංවිධානය ඉදිරියට යනු ඇතැයි යන විශ්වාසය මහජනයාගේ කතාබහ තුළ දක්නට නොලැබුණි. එයට වෙනස්ව මෙම සාමකාමී තත්ත්වය අහිමිවී යාදෝ යන අවිනිශ්චිත මානසික තත්ත්වය සමඟින් ලැබෙන කෙටි කාලය තුළදී තම ජීවිතය කුඩා අංශුවක පමණ ප්‍රමාණයෙන් හෝ ගොඩනඟා ගත යුතු යන අසහනය සමඟින් ජනයා කටයුතු කරන්නට වූහ. දෙමළ ජනයා වාසය කරන ප්‍රදේශය හරහා ගමන් කරන A9 මාර්ගය තම පාලනය යටතේ පවත්වාගෙන යාමේ හමුදාමය සහ දේශපාලන වාසි ප්‍රමුඛ කරගෙන ලංකාවේ රජය සහ විමුක්ති කොටි තම ක්‍රියාමාර්ගය ඉදිරියට ගෙන යමින් උන්හ. එහෙයින් මෙම පාරට ආසන්නයෙහි ඇතිවූ සටන්වලින් අහිමි වූ ජීවිත සංඛ්‍යාව දහස් ගණනක් විය. 1995 වසරෙහි සිට 2002 දක්වා වන කාල වකවානුව තුළ මම සෘජුවම සම්බන්ධ වූ සිදුවීම් මූලික කරගෙන මෙම ඉතිහාසය දිගහැර දැක්වීම ප්‍රයෝජනවත් යැයි සිතමි.

-මතු සම්බන්ධයි-

JAPANESE
By a qualified experienced teacher with proven results
PREP to VCE
- Rapid Learning Strategies
- Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.
- Exam Revision and Preparation for VCE written and oral exam.

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University) , B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.

Contact Number: 0425 396 975